**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව**
**බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය**
**බාහිර උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි කිරීම - 2022**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය මඟින් පවත්වනු ලබන පහත සඳහන් බාහිර උපාධි පාඨමාලා සඳහා සිසුන් ලියාපදිංචි කිරීමට තෝරා ගැනීම පිණිස සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් 2022.10.30 වන දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

**මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය මගින් ඉදිරිපත් කරනු ලබන බාහිර උපාධි පාඨමාලා**

1. ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව
2. සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව
3. ශාස්ත්‍රවේදී ඉංග්‍රීසි (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව

**කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය මගින් ඉදිරිපත් කරනු ලබන බාහිර උපාධි පාඨමාලා**

1. වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව
2. විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාව
3. විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව

එක් එක් පාඨමාලාවට අදාළ තොරතුරු external.sjp.ac.lk යන වෙබ් අඩවියෙහි සඳහන් වේ.

**අයදුම්පත් ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදය**

1. අයදුම්පත් යොමු කළ හැක්කේ මාර්ගගත ක්‍රමවේදය (Online) ඔස්සේ පමණි. ඒ අනුව external.sjp.ac.lk වෙබ් අඩවියට පිවිස නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත යොමු කළ (Submit) යුතුය.
2. අයදුම්පත යොමු කිරීමේදී පහත සඳහන් ලේඛන ස්කෑන් කර (Scan) උඩුගත කළ යුතුය.
   i. සහතික කරන ලද උප්පැන්න සහතිකයේ පිටපතක්.
   ii. අධ්‍යාපන සහතිකවල සහතික කරන ලද පිටපත්.
   iii. ජාතික හැඳුනුම්පතේ සහතික කරන ලද පිටපතක්.
   iv. බැංකුවට මුදල් ගෙවන ලද රිසිට්පතේ මුල් පිටපත.
3. ඉහත 2 හි සඳහන් ලේඛනවල පිටපත් සමග සම්පූර්ණ කරන ලද අයදුම්පතෙහි පිටපතක් (Hard copy) පහත සඳහන් ලිපිනයට 2022.10.30 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

   (සැ. යු. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවර තමා ඉල්ලුම් කරන උපාධි පාඨමාලාවේ නම සඳහන් කර එවිය යුතුය)

4. ඔබ විසින් අයදුම් කිරීමට අපේක්ෂිත උපාධි පාඨමාලාව සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ, ගංගොඩවිල, මහජන බැංකු ශාඛාවේ පහතින් දක්වා ඇති ගිණුම් අංකවලට බැර වන පරිදි දිවයිනේ ඕනෑම මහජන බැංකු ශාඛාවකට රු. 3000/- මුදලක් (ආපසු නොගෙවන) ගෙවා ලබා ගත් රිසිට් පතෙහි මුල් පිටපත අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය. ඔබ ඉල්ලුම් කිරීමට අපේක්ෂිත බාහිර උපාධි පාඨමාලාවට අදාළව පහත සඳහන් ගිණුම් අංකයට පමණක් මුදල් ගෙවීම අනිවාර්ය වේ (බැංකු රිසිට්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගත යුතු වේ).

| | උපාධි පාඨමාලාව | ගිණුම් අංකය |
|---|---|---|
| 1 | ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව | **072010007119** |
| 2 | සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව | **072010007069** |
| 3 | ශාස්ත්‍රවේදී ඉංග්‍රීසි (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව | **072010007028** |
| 4 | වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව | **072010007036** |
| 5 | විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාව | **072010007051** |
| 6 | විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව | **072010007127** |

**අයදුම්කරුවන් සඳහා උපදෙස් ඃ**

- **ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයට අනුබද්ධ කිසිදු නියෝජිත ආයතනයක් නොමැත. එබැවින් අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා external.sjp.ac.lk යන වෙබ් අඩවියට පිවිස උක්ත සඳහන් ක්‍රමවේදය පමණක් අනුගමනය කළ යුතුය. වෙනත් නියෝජිතායතන හරහා ඉදිරිපත් කරන අයදුම්පත් පිළිබඳව විශ්වවිද්‍යාලය වගකියනු නොලැබේ.**
- **ප්‍රමාද වී ලැබෙන සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**
- **එක් අයදුම්කරුවකුට උපාධි පාඨමාලා කිහිපයකට අයදුම් කළ හැකිය. ඒ සඳහා වෙන් වෙන්ව අයදුම්පත් යොමු කළ යුතුය.**

**අයදුම්පත් යොමු කළ යුතු ලිපිනය ඃ**

නියෝජ්‍ය ලේඛකාධිකාරී
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
තැ. පෙ. අංක 10
ගංගොඩවිල
නුගේගොඩ

ලේඛකාධිකාරී
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
2022.09.25

# University of Sri Jayewardenepura, Sri Lanka
## External Degrees and Extension Courses Unit
## Enrollment for the External Degree Programs - 2022

Applications are called from the qualified candidates for the following external degree courses offered by the External Degrees and Extension Courses Unit of the University of Sri Jayewardenepura until **30th October 2022.**

**External Degree Courses Offered by the Faculty of Humanities and Social Sciences:**

1. Bachelor of Arts (General) External Degree Program
2. Bachelor of Social Sciences in Environmental and Development Studies (General) External Degree Program
3. Bachelor of Arts in English (General) External Degree Program

**External Degree Courses Offered by the Faculty of Management Studies and Commerce:**

1. Bachelor of Commerce (General) External Degree Program
2. Bachelor of Science in Management (Public) (General) External Degree Program
3. Bachelor of Science in Business Studies (General) External Degree Program

Relevant details of each degree program are mentioned on the website: www.external.sjp.ac.lk

**Procedure for Sending the Applications:**

1. Applications can only be submitted online. Accordingly, the duly filled applications should be submitted by visiting www.external.sjp.ac.lk.
2. Scanned copies of the following documents should be uploaded with the application.
   - I. A certified copy of the birth certificate
   - II. Certified copies of certificates related to educational qualifications
   - III. Certified copy of the NIC
   - IV. The original copy of bank receipt

3. The hard copy of the completed application along with the copies of the documents mentioned under 2 above, and the original receipt of Rs. 3000/ (non-refundable) paid to any branch of the People's Bank in the island to be credited to the EDECU's account numbers (given in the Table) of the People's Bank, Gangodawila, should be posted via registered post to the address given below on or before **30.10.2022.** It is essential that the payment should be made to the correct account number in relation to the respective degree program you applied (Applicants are advised to keep a photocopy of the receipt).

**(Note: the name of the relevant degree program should be mentioned on the top left corner of the envelope)**

| | Degree Program | Account Numbers |
|---|---|---|
| 1 | Bachelor of Arts (General) External Degree Program | **072010007119** |
| 2 | Bachelor of Social Sciences in Environmental and Development Studies (General) External Degree Program | **072010007069** |
| 3 | Bachelor of Arts in English (General) External Degree Program | **072010007028** |
| 4 | Bachelor of Commerce (General) External Degree Program | **072010007036** |
| 5 | Bachelor of Science in Management (Public) (General) External Degree Program | **072010007051** |
| 6 | Bachelor of Science in Business Studies (General) External Degree Program | **072010007127** |

**Instructions to Candidates:**

- ❖ There is no affiliated unit or institute that undertakes/ performs the duties and responsibilities of the External Degrees and Extension Courses Unit (EDECU). Therefore, it is mandatory to visit **external.sjp.ac.lk** and adhere to the proper procedure mentioned above in submitting the applications. The EDECU does not take any responsibility for the applications sent by any third parties.
- ❖ Delayed and incomplete applications will be rejected.
- ❖ One candidate can apply for several degree programs. For that, it is required to submit separate applications.

Address to which applications should be sent:

The Deputy Registrar
External Degrees and Extension Courses Unit
University of Sri Jayewardenepura
P.O. Box No: 10
Gangodawila
Nugegoda

The Registrar
University of Sri Jayewardenepura
25.09.2022